කල්බදු මූල්‍යකරණ පනත යටතේ නිකුත් කරනු ලබන විධාන 2018 අංක 02 2018 පෙබරවාරි 08

# මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබාදීමේදී වටිනාකම් මත ණය අනුපාත

**2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය යටතේ නිකුත් කරන ලදී**

මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් වෙනුවෙන් වටිනාකම් මත ණය අනුපාත හඳුන්වා දීම සඳහා, බැංකු නොවන මූල්‍ය ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුවේ අධ්‍යක්ෂ (මෙහි මින්මතු "අධ්‍යක්ෂ" යනුවෙන් සඳහන් කරනු ලබන) විසින් පහත විධානයන් නිකුත් කරනු ලැබේ.

1. කල්බදු මූල්‍යකරණ පනත යටතේ බලගැන්වීම

1.1 2000 අංක 56 දරන කල්බදු මූල්‍යකරණ පනතේ 34 වන වගන්තිය ප්‍රකාරව, එම පනතේ 3 වන වගන්තිතයේ (ඇ) ඡේදයේ විධිවිධානයන්ට අනුව ලියාපදිංචි කල්බදු මූල්‍යකරණ ආයතන ලෙස සඳහන් කරන පොදු සමාගම්වලට (මෙහි මින්මතු "විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම" යනුවෙන් සඳහන් කරනු ලබන සමාගම්වලට) පොදු විධාන නිකුත් කිරීම සඳහා අධ්‍යක්ෂ වෙත බලතල පැවරී ඇත.

2. උපරිම වටිනාකම් මත ණය අනුපාත

2.1 2018 ජනවාරි 01 සිට, මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ලබාදෙන ණය පහසුකම එම වාහන වල වෙළඳපොළ වටිනාකමෙන් පහත දැක්වෙන ප්‍රතිශත වටිනාකම නොඉක්මවිය යුතුය.

(i) ලියාපදිංචි නොකළ වාහන සහ පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා අඩු කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන සඳහා,

**වගු අංක 01 - වටිනාකම මත ණය අනුපාත**

| වාහන වර්ගය | මෝටර් රථ ප්‍රවාහන දෙපාර්තමේන්තුවේ වාහන පන්තිය | විද්‍යුත් වාහන | වෙනත් |
|---|---|---|---|
| වාණිජ වාහන | C1, C, CE, D1, D, DE, G1, G, J | 90% | 90% |
| මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගී වාහන (SUV) හා වෑන් රථ | B[සැහැල්ලු ට්‍රක් රථ සහ තනි ආසන (single cab) කැබ් රථ හැර] | 90% | 50% |
| ත්‍රී රෝද රථ | B1 | 90% | 25% |
| වෙනත් ඕනෑම වාහන | A1, A, B පන්තිය යටතේ වර්ගීකරණය කර ඇති සැහැල්ලු ට්‍රක් රථ සහ තනි ආසන (single cab) | 90% | 70% |
| දෙමුහුම් මෝටර් කාර්, ක්‍රීඩා උපයෝගී වාහන (SUV) සහ වෑන් රථ | B [සැහැල්ලු ට්‍රක් රථ සහ තනි ආසන (single cab) කැබ් රථ හැර] | 70% | |

(ii) පළමු ලියාපදිංචියෙන් පසු වසරකට වඩා වැඩි කාලයක් ශ්‍රී ලංකාව තුළ භාවිතා කරන ලද ලියාපදිංචි වාහන සඳහා අනුපාතය සියයට 70 ක් විය යුතුය.

3. උපරිම වටිනාකම් මත ණය අනුපාතයෙන් නිදහස් කිරීම

3.1 සංචාරක සහ/හෝ ප්‍රවාහන කටයුතුවල නිරත ඕනෑම සමාගමකට ඒවායේ මූලික ව්‍යාපාර කටයුතු සඳහා උපයෝගි කර ගැනීමට වාහන සංචිත මිලදී ගැනීමේදී ප්‍රදානය කරනු ලබන ණය පහසුකම් සඳහා ඉහත විධාන 2 හි සඳහන් සීමාවන් අදාල නොවේ. එසේ වුවද, එලෙස මූල්‍යනය කරන ලද වාහන පළමු ලියාපදිංචි කිරීමේ දින සිට වසරක් ඇතුළත කිසිදු පුද්ගලයෙකුට හෝ ආයතනයකට පැවරීම සිදු කල නොහැකිය.

3.2 මෙම වාහන ප්‍රභේදය සඳහා ණය පහසුකම් ලබා දීමේදී විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් අභ්‍යන්තර සීමාවන් පවත්වා ගත යුතු අතර ප්‍රමාණවත් අවදානම් කළමනාකරණ ක්‍රමවේදයන් අනුගමනය කල යුතුය.

4. වාහන සඳහා වෙනත් ණය පහසුකම්

4.1 ඉහත 2 හා 3 විධානයන්ට අනුව ප්‍රදානය කරන ලද ණය පහසුකම් හැර, මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ණය පහසුකම් ප්‍රදානය නොකළ යුතුය.

5. අර්ථ නිරූපන

5.1 ණය පහසුකම් යන්නෙන් අවසාන පාරිභෝගිකයා වෙත ප්‍රදානය කරනු ලබන කල්බදු මූල්‍යකරණ, කුලී සින්නක්කර පහසුකම් සහ මෝටර් වාහන මිලදී ගැනීමේ හෝ භාවිතා කිරීමේ අරමුණු සඳහා ලබා දෙන වෙනත් ණය පහසුකම් අදහස් වේ.

5.2 මෝටර් වාහනයේ වටිනාකම යන්නෙන් වෙළඳපොළ වටිනාකම අදහස් වේ. මෝටර් වාහනවල වටිනාකම තක්සේරු කිරීමේදී විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් සඳහා පහත දැක්වෙන ක්‍රම උපයෝගී කළ හැකිය.

(i) අලුත්ම වාහන සඳහා - බලයලත් නියෝජිතයෙකු විසින් දෙනු ලබන වටිනාකම

(ii) පාවිච්චි කර මෙරටට ආනයනය කරනු ලබන වාහන සඳහා - රේගුවේදී සලකා බලන ලද වටිනාකම හෝ වාහන වෙළඳ ආයතන විසින් ලබා දෙන වටිනාකම

(iii) ලියාපදිංචි වාහන සඳහා - වෘත්තීය තක්සේරුකරුවෙකු විසින් ලබාදෙන වටිනාකම

5.3 විශේෂිත කල්බදු මූල්‍යකරණ සමාගම් විසින් ණය පහසුකම ප්‍රදානය කරන අවස්ථාවේදීම වාහනයේ තක්සේරු වටිනාකම ලබා ගැනීමට සහ නිවැරදි හා සාධාරණ වටිනාකම ලබා දෙන බවට වගබලා ගත යුතුය.

5.4 විධාන 3.1 හි සඳහන් වාහන සංචිත යන්නෙන් වාහන දෙකක් හෝ ඊට වැඩි ප්‍රමාණයක් අදහස් වේ.

5.5 විධාන 3.1 හි සඳහන් සංචාරක කටයුතු වල නිරත සමාගමක් යන්නෙන් සංචාරක කටයුතු වෙනුවෙන් සේවා සැපයීම සඳහා ශ්‍රී ලංකා සංචාරක සංවර්ධන අධිකාරිය හෝ වෙනත් අධිකාරියක් සමඟ ලියාපදිංචි වී ඇති සමාගමක් අදහස් වේ.

5.6 විධාන 3.1 හි සඳහන් ප්‍රවාහන කටයුතුවල නිරත සමාගමක් යන්නෙන් භාණ්ඩ හෝ මගීන් ප්‍රවාහනය කිරීමේ ව්‍යාපාර අරමුණු සඳහා ඕනෑම රාජ්‍ය අධිකාරියක් සමඟ ලියාපදිංචි වී ඇති ඕනෑම ආයතනයක් අදහස් වේ.

6. පෙර විධානයන් අහෝසි කිරීම්

6.1 මෙයින්, පහත දැක්වෙන විධානයන් අහෝසි කෙරේ.

i. 2017 අංක 01 දරන කල්බදු මූල්‍යකරණ (මෝටර් වාහන සඳහා ණය පහසුකම් ලබාදීමේදී වටිනාකම මත ණය අනුපාතය) විධානය.

ii. 2017 අංක 02 සහ 2017 අංක 03 දරන කල්බදු මූල්‍යකරණ (මෝටර් වාහන සඳහා ණය සහ අත්තිකාරම් ලබාදීමේදී වටිනාකම මත ණය අනුපාත විධාන සංශෝධනය කිරීම) විධාන.

ඩබ්. රණවීර
**අධ්‍යක්ෂ, බැංකු නොවන මූල්‍ය**
**ආයතන අධීක්ෂණ දෙපාර්තමේන්තුව**
**ශ්‍රී ලංකා මහ බැංකුව**